(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **113**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 නොවැම්බර් 28 සිකුරාදා පූ. භා. 9.00** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය,** ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලෆ්ෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු එරංග වීරරත්න මහතා, ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු ජේ.සී. අලවතුවල මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**

**ගරු මුජිබුර් රහුමාන් මහතා**

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**

**ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදන කරන ලදී:—

I

"ගරු මන්ත්‍රීවරුනි,

මේ වනවිට රට තුළ පවතින හදිසි ආපදා තත්ත්වය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව 2025 නොවැම්බර් 27 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් අද දින අයවැය කාරක සභා අවස්ථාවේ විවාදය නොපැවැත්වීමටත්, 2025 නොවැම්බර් 29, එනම් හෙට දින පාර්ලිමේන්තු රැස්වීම් නොපැවැත්වීමටත් තීරණය කරන ලද බවත්, ඒ අනුව 2026 අයවැය කාරක සභා අවස්ථාවේ වැඩසටහනෙහි:

- වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
- තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
- කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය

යන අමාත්‍යාංශවල වැය ශීර්ෂ විවාදයට ගැනීමට නියමිතව තිබූ දින සංශෝධනය කර තිබෙන බවත් එකී සංශෝධිත දින පිළිබඳව මෙම ගරු සභාව දැනුම්වත් කිරීමට කැමැත්තෙමි:

- 2025 නොවැම්බර් 29 සෙනසුරාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ සහ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2025 දෙසැම්බර් 01 සඳුදා දින පූ.භා. 10.30 සිට අ.භා. 6.00 දක්වා ද (සම්මත කිරීම අ.භා. 6.00 ට), බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහ පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ එදිනම අ.භා. 6.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා ද (සම්මත කිරීම මධ්‍යම රාත්‍රී 12.00 ට); සහ
- වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2025 දෙසැම්බර් 02 අඟහරුවාදා පූ.භා. 10.30 සිට අ.භා. 6.00 දක්වා ද (සම්මත කිරීම අ.භා. 6.00 ට), නොවැම්බර් 28 සිකුරාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අ.භා. 6.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා ද (සම්මත කිරීම මධ්‍යම රාත්‍රී 12.00 ට);

විවාදයට ගැනීමට නියමිත බව මෙම සභාවට දන්වා සිටිමි."

II

"ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිනී නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය විසින් 2025 නොවැම්බර් 18 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු 142(2) වගන්තියේ (ද) ඡේදය යටතේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 සැප්තැම්බර් 04 දිනැති අංක 2452/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර, එම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාවේ අතුරු අනුව්‍යවස්ථාව සහ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 6(ආ), (ඇ) සහ (ඒ), 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 35 වගන්තිය යටතේ නියෝග සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2025 නොවැම්බර් 13 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.00 සිට පූ. භා. 9.30 දක්වා විය යුතු ය. පූ. භා. 9.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල සහ 2025 නොවැම්බර් 13 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණ ද, 'විසර්ජන' පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා වෙන් කළ 2025 දෙසැම්බර් 01 සඳුදා සහ 02 අඟහරුවාදා දිනවල පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.00 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා ද විය යුතු ය. මධ්‍යම රාත්‍රී 12.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. මධ්‍යම රාත්‍රී 12.00 ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— අද දින විසිර යැමේ දී මෙම පාර්ලිමේන්තුව 2025 දෙසැම්බර් 01 සඳුදා පූ. භා. 9.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ නියෝග:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාවේ අතුරු අනුව්‍යවස්ථාව සහ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 6(ආ), (ඇ) සහ (ඒ), 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 35 වගන්තිය යටතේ රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2025 ඔක්තෝබර් 24 දිනැති අංක 2459/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය" යි සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; පූ. භා. 9.24 ට කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව අද දින සභා සම්මතිය අනුව 2025 දෙසැම්බර් 01 සඳුදා පූ. භා. 9.00 වනතෙක් කල් තබන ලදී.